## 2011 ගෝලීය ක්‍රියාකාරී සතිය

## මහා කතාවලිය - පාඩම් සැලැස්ම

කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට වහාම අධ්‍යාපනය ලබා දෙන්න - "එය ඔවුන්ගේ අයිතිවාසිකමකි. එම අයිතිවාසිකම සුරකින්න"

**අරමුණු**

1. මිලියන සංඛ්‍යාතළමයින් හා වැඩිහිටියන් කිසිදු දිනක පාසල් අධ්‍යාපනයට අවස්ථාවක් නොලැබීම හා එම පිරිසෙන් බහුතරයක් ගැහැණු ළමයින් හා කාන්තාවන් වීම පිළිබඳව සාකච්ඡා කිරීම.
2. සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් මඟින් මෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව විමසිලිමත් වීමට ලොව පුරා සිසුන් දිරිමත් කිරීම.
3. ලෝක නායකයන් ලබා දුන් පොරොන්දු හා එම පොරොන්දු ඉටු නොවූ අවස්ථා පිළිබඳ සාකච්ඡා කිරීම.
4. ලොවපුරා මේ පිළිබඳව අප ගන්නා ප්‍රයත්නයට ළමයින්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා ඔවුන්ගේ පණිවුඩ ප්‍රචලිත කළ හැකි ආකාරය පෙන්වා දීම.

**පාඩම අවසානයේ ඉගෙනුම ලබන්නන්**

- ගැහැණු ළමයින්ට අධ්‍යාපනය ලබාදීමෙන් ලද හැකි ඵලදායි ප්‍රතිඵල අවබෝධ කර ගැනීම.
- ලොව විවිධ රටවල ළමයින්ගේ ජීවන රටාව තුළ පවත්නා වෙනස්කම් අගය කිරීම.
- පාසලෙන් බැහැරව සිටීම කෙරෙහි බලපා ඇති බාධක මෙන්ම එම බාධක ජයගෙන පාසල් අධ්‍යාපනය ලැබීමට කළ හැකි දේ පිළිබඳව අවබෝධ කර ගැනීම.
-

**'අ' කොටස**

හැඳින්වීම (මිනිත්තු 5)

මෙම මහා කතාවලිය සඳහා ලොව පුරා සිටින විශිෂ්ඨතම කාන්තාවන්ගේ සහභාගීත්වයෙන් පාසල් අධ්‍යාපනය අහිමි වූ මිලියන සංඛ්‍යාත කාන්තාවන් හා ගැහැණු ළමයින් උදෙසා සාමූහිකව එක් වී කළ හැකි දේ පිළිබඳ ව ළමයින්ට පැහැදිලි කර දීම.

පාසලෙන් බැහැරව කොපමණ සංඛ්‍යාවක් සිටීද එම සංඛ්‍යාවෙන් කිනම් ප්‍රමාණයක් ගැහැණු ළමයින් හා කාන්තාවන් ද යන්න විමසීම.

ප්‍රධාන කරුණු කිහිපයක් පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීම.

- ලොව පුරා මිලියන 72ක් පමණ ළමයින් පාසලෙන් බැහැරව සිටීම.
- එම සංඛ්‍යාවෙන් 54%ක ප්‍රතිශතයක් එනම් මිලියන 39 පමණ ගැහැණු ළමයින් වීම.
- අධ්‍යාපනය නොලද වැඩිහිටි ජනගහණයෙන් 2/3 කාන්තාවන් වීම.

පාසල් අධ්‍යාපනය නොලද ගැහැණු ළමයකු බොහෝ අවස්ථාවල දී ඃ

- බාල වයසේ දී විවාහවීම.
- මන්දපෝෂණයෙන් යුත් දරුවන් බිහි කිරීම හා එම දරුවන් අකාලයේ රෝගීව මියයාම.
- දිළිඳු අය බවට පත්වීම.

ශ්‍රේෂ්ඨත්වයට පත් කාන්තාවන් හෝ ගැහැණු ළමයින් පිළිබඳව අසා ඔවුන් පාසල් අධ්‍යාපනය ලැබූ අය ද යන්න විමසීම.

'ආ' කොටස

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ භූමිකාව හා අධ්‍යාපනය**

පිරිමි ළමයින් හා ගැහැණු ළමයින් විෂයයෙහි පවත්නා වෙනස්කම් වර්ධනය කිරීමෙහි ලා බලපා ඇති අවස්ථා පිළිබඳව ද ඔවුන්ගේ අධ්‍යාපනය උදෙසා එම සාදක ඍනාත්මකව බලපා තිබේ ද යන්න විමසීම.

සංවර්ධනය වෙමින් පවත්නා රටවල කාන්තාවන්ගේ අධ්‍යාපන අවස්ථාවල වැදගත්කම පිළිබඳ විමසීම.

(ඉහළ ශ්‍රේණිවල ළමයින් සමඟ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය පිළිබඳ සාකච්ඡා කිරීම)

සාරාංශය

- 1989 ළමා අයිතිවාසිකම් පිළිබද ප්‍රඥප්තිය සම්මත වීම හා එය සියලු මානව හිමිකම් පිළිබඳ සවිස්තරාත්මක කරුණු අන්තර්ගත පළමු නෛතික අන්තර්ජාතික ලේඛනය බව.
- ලොව පුරා වෙසෙන සියලු ළමයින්ගේ තත්ත්වය, ආගම, ජාතිය පිළිබඳ වෙනසකින් තොරව ළමයින් සතු මූලික මානව හිමිකම් විස්තරාත්මකව එහි ඇතුළත් වීම. වැඩිහිටි අවධිය දක්වා ජීවත්වීමට ඇති අයිතිය සංවර්ධනය සඳහා ඇති අයිතිය හානිකර බලපෑම්වලින් ද ලිංගික අපයෝජන හා සූරා කෑම්වලින් ආරක්ෂා වීමට ඇති අයිතිය, ළමයාගේ අභිලාෂ අනුව සංස්කෘතික හා සමාජයීය වශයෙන් තම පවුල සමඟ සහභාගීවීමට ඇති අයිතිය. සමානාත්මතාව, ළමා ලැදියා සඳහා කැපවීම, ජීවත්වීමට පැවැත්මට හා සංවර්ධනය සඳහා කටයුතු කිරීම හා ළමා අදහස්වලට ගරු කිරීම සම්මුතියේ ප්‍රධාන මූලධර්ම වීම.
- රටවල් 194 ක් මේ වන විට විශ්වමය වශයෙන් ප්‍රඥප්තිය පිළිගෙන තිබීම.
- මෙම සම්මුතිය සඳහන් කරුණුවලට එකඟ වීම, ක්‍රියාත්මක කිරීම සඳහා මෙන්ම ළමයින්ගේ අයිතිවාසිකම් ස්ථාපිත කිරීම හා සුරැකීම කෙරෙහි අන්තර්ජාතික ප්‍රජාව එකඟත්වයට පැමිණීම.

නොදියුණු රටවල ළමයින්ගේ භූගෝලීය වශයෙන් ද විවිධ සංස්කෘතීන් හා ජීවන තත්ත්වයන් පිළිබඳව ද අවබෝධයක් ලබා දෙමින් ඒ හා සම්බන්ධ අදහස් හුවමාරු කර ගැනීම.

ගැහැණු ළමයින්ට හා පිරිමි ළමයින්ට අධ්‍යාපන සම අවස්ථා ලබාදීම සඳහා කළහැකි දේ සාකච්ඡා කිරීම. විවිධ රැකියා පිළිබඳ විමසා එම රැකියා ගැහැණු පිරිමි වශයෙන් වෙන් කළ හැකි ද යන්න විමසීම.

නිවසේ දී ගැහැණු පිරිමි වෙන් වෙන් ව කරණු ලබන දෛනික කටයුතු විමසීම හා එසේ වෙන් කිරීම සාධාරණ ද යන්න විමසීම.

නිවසේ වැඩ අධික වීම හේතුවෙන් දෙමව්පියන් පාසල් යාමට ඔබට බාධා කළහොත් සිතේ පහල වන හැඟීම් විමසිම.

පාසල් යාමේ වැදගත්කම හා විශේෂයෙන් ගැහැණු ළමයින් හා ඇතැම් ළමයින් පාසල් නොයාමට බලපා ඇති හේතු සාදක විමසීම.

*මෙහි දී ඇතැම් ප්‍රතිචාර වශයෙන්*

- ඇතැම් ළමයින් අර්බුදකාරී, ගැටුම්කාරී හා ස්වාභාවික ආපදාවලට ප්‍රදේශවල ජීවත්වීම.
- ඇතැම් සංස්කෘතීන් හි අධ්‍යාපනය සඳහා අරමුදල් සීමිත වූ අවස්ථාවල ගැහැණු ළමයින්ට ප්‍රමුඛත්වයක් නොදීම.
- බාල වයස් විවාහවලට ඇතුළත් වීම හා නිවසේ එදිනෙදා වැඩ කටයුතු සඳහා කැපවීම හේතුවෙන් ගැහැණු ළමයින්ට පාසැල් හැර යාමට බල කිරීම.
- පාසලෙන් ඉතා දුර බැහැර ප්‍රදේශවල ජීවත්වීම ද පාසල් යාමේ දී ඇතිවිය හැකි අනතුරුදායක බව නිසා ද සුවිශේෂී ව ගැහැණු ළමයින් හිංසනයට හා සැහැසිකම්වලට ගොදුරු වීම දෙමව්පියන් විසින් ඇතැම් ළමයින් නිවසේ රඳවා ගැනීම .
- ඇතැම් ළමයින්ට දුප්පත්කම නිසා තම නිවසට ආදායම් ඉපයීමට බලකිරීම හේතුවෙන් පාසල් නොයවා නිවසේ රඳවා ගැනීම.
- පාසල් පොත්පත් සහ නිළ ඇඳුම් සඳහා මුදල් නොමැතිවීම.
- පාසල් ගාස්තු ගෙවීම සඳහා මුදල් නොමැතිවීම.
- සෑම ළමයකුටම ඉගෙනීමට පාසල් නොතිබීම.
- ප්‍රමාණවත් ගුරුවරුන් සංඛ්‍යාවක් නොමැතිවීම.

**'ඇ' කොටස**

(කාලය විනාඩි 10)

මේ සඳහා කුමක් කළ යුතු වන්නේ ද

ගැහැණු ළමයින්ට පාසල් යාම සඳහා පහසුකම් සැළසීමේ දී කුමක් කළ යුතු ද යන්න විමසීම. මෙහි දී ලැබිය හැකි ප්‍රතිචාර කිහිපයක් වන්නේ,

- සංවර්ධනය වෙමින් පවත්නා ලෝකයේ ලෝකයේ  ගැහැණු ළමයින්ගේ අධ්‍යාපනය සඳහා රාජ්‍ය සහාය ඉහල නැංවීම.
- ගැහැණු ළමයින්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කර ගැනීම සඳහා සනීපාරක්ෂක පහසුකම් සැලසීම.
- ගැහැණු ළමයින්ගේ තත්ත්වය පහත් කොට හුවා දක්වන චිත්‍ර හා සිතුවම් ඉවත් කිරීම.
- පාසල් අධ්‍යාපනය හා සම්බන්ධ පාසල් ගාස්තු හා වෙනත් සැඟවුනු ගාස්තු ඉවත් කිරීම.

- පිරිමි ළමයින් සහ පුරුෂ පක්ෂය, කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ අධ්‍යාපනය උදෙසා උද්දේශනය සඳහා දිරිමත් කිරීම.

දේශපාලනඥයකු සහභාගි වන්නේ නම් සහභාගිවන්නන් සාමූහිකව සම්බන්ධ කර ගනිමින් ගුරුවරයා පහත සඳහන් ප්‍රශ්න යොමු කරන විට දේශපාලඥයන්ගෙන් ප්‍රතිචාර ලබා ගැනීම

- ලෝකයේ ළමයින් කොපමණ සංඛ්‍යාවක් පාසලෙන් බැහැරව සිටීද
- අධ්‍යාපනය ලැබීමේ දී වඩාත් අවාසිදායක තත්ත්වයට පත් කණ්ඩායමට අයත්වන්නේ කවුරුන්ද?
- අධ්‍යාපනය තුළින් ප්‍රසිද්ධියට පත් කාන්තාවක් නම් කරන්න.
- අධ්‍යාපනය වැදගත්කම හුවා දක්වන හේතු කීපයක් සඳහන් කරන්න
- පිරිමි ළමයින් හා ගැහැණු ළමයින්ගේ අධ්‍යාපනය නංවාලීමට කුමක් කළ යුතු ද?

## ‘ඇ’ කොටස

ක්‍රියාකාරකම් (විනාඩි 30)

ගැහැණු ළමයින්ට අධ්‍යාපනය ලබා දීමේ වැදගත්කම පිළිබඳ කරුණු අනාවරණය කර ගැනීමට අදහස් විමසීම හා ඒ සඳහා චිත්‍රයක් සිතුවමක් උපයෝගී කර ගනිමින් සහභාගී වන්නන්ගෙන් ‘‘ගැහැණු ළමයින්ගේ අධ්‍යාපනය අපට උපකාර වන්නේ කෙසේ ද යන්න විමසීම.

අමුණා ඇති චිත්‍ර කොටස් පත්‍රිකාව පරිශීලනය කිරීම ද ස්වේච්ඡා පදනම මත චිත්‍ර තරගයක් පැවැත්වීම ද ළමයින්ට හා පාසලට චිත්‍ර ළඟ තබා ගැනීමට ද අවස්ථාව සලසා දීම.

**ප්‍රතිචාර සඳහා උදාහරණ**

- උගත් ගැහැණු දරුවකු උගත් කාන්තාවක් බවට පත්වීමට ඇය සෞඛ්‍ය සම්පන්න වීම හා ආර්ථික වශයෙන් බල වන්ත වීම ද ඇයගේ දරුවන් වඩාත් පාසල් යාමට පෙළඹීම ද සිදුවන බව
- උගත් කාන්තාවෝ තම දරුවන්ට හා අන්‍යයන්ට වඩාත් යහපත් සෞඛ්‍යමය රැකවරණය ලබා දීම.
- බාල වයස් විවාහ පමා කිරීමට හැකිවීම හා ලිංගික සම්ප්‍රේෂණ රෝග අවම කිරීමට හැකි වීම.
- කිසිදු දිනක පාසල් අධ්‍යාපන වරප්‍රසාද නොලද ගැහැණු ළමයෙකුගේ ජීවිතය පිළිබඳ උපකල්පනය කිරීමට සලස්වා සහභාගි වන්නන් දෙතුන්දෙනෙකුට ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම.

ගුරුවරයා මෙහි දී උදාහරන ගෙනහැර දක්වමින් ගැහැණු ළමයින් ඇතුලු සියල්ලන්ට අධ්‍යාපනයේ වාසිදායක තත්ත්වයන් ගෙනහැර පෑම.

ඇතැම් උදාහරණ

- උගත් ජනතාව සෞඛ්‍ය සම්පන්න තීරණ ගැනීම හා සෞඛ්‍ය සම්පන්න ජීවිතයට අදාල තොරතුරු ලබා ගැනීමට සමත් වීම.
- කුසගින්න පිටු දැකීම සඳහා කටයුතු කිරීම. උගත් කාන්තාවන් සෑම විටම තම දරුවන්ගේ ඉහළ පෝෂණ මට්ටම පිළිබඳ සැලකිලිමත් වීම.

- අධ්‍යාපනය ජීවිත සුරකියි, උගත් මවක් බිහි කරන දරුවාට පස් හැවිරිදි විය වන විට දිවි පැවැත්ම අධ්‍යාපනයක් නොලද මවකගේ දරුවකුට වඩා දෙගුණයකින් වැඩිබව.
- දුප්පත්කම තුරන් කිරීම සඳහා අධ්‍යාපනය ඉවහල් වන බව.
- සියලුම කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට පාසල් යාමට අවස්ථාව සලසා දීමේ සාධාරණත්වය පිළිබඳ සෑම දෙනාගේම අදහස් විමසීම.

# චිත්‍ර තරඟය 2011

අප සැමට ගැහැණු ළමුන්ගේ අධ්‍යාපනය උදව් වන්නේ කෙසේද?

(යු.එන්.ජී.අයි.) හි නැගෙනහිර ආසියානු පැසිපික් හා දකුණු ආසියානු හවුල්කරුවෝ අධ්‍යාපනයෙහි ස්ත්‍රී පුරුෂ සමානතාවය ඉහල නැංවීම සඳහාවන තෙවන තරඟාවලිය සඳහා ආරාධනා කරයි.

ගැහැණු ළමුන්ගේ අධ්‍යාපනය අප සැමට උදව් විය හැක්කේ කෙසේද යන්න පිළිබඳ ඔබේ අදහස් චිත්‍ර මගින් එළි දැක්වීමට ඔබට මෙම වසරේ ආරාධනය කරයි.

**ත්‍යාග**

ජයග්‍රාහී චිත්‍ර 13 යු.එන්.ජී.අයි. හි 2012 ස්ත්‍රී පුරුෂ අධ්‍යාපනය පිළිබඳ දින දර්ශනයේ අංගයක් ලෙස එකතු කරනු ඇත. මෙම දින දර්ශනය ආසියානු කළාපය පුරා බෙදා හරිනු ඇත.

- ජයග්‍රාහකයින් සඳහා සහතිකපත් පරිනමනු ඇත.
- ජයග්‍රාහී චිත්‍ර සංවිධායකයින්ගේ වෙබ් පිටුව මඟින් ප්‍රදර්ශනය කරනු ඇත. ජයග්‍රාහී චිත්‍ර සහ අනෙකුත් ඉදිරිපත් කරන ලද චිත්‍ර යුඑන්ජීඅයි හවුල්කරුවන් ඔවුන්ගේ ප්‍රකාශන සදහා ඉදිරිපත් කිරීම්, වෙබ් පිටු, උද්දේශන මෙවලම් ලෙස පමණක් භාවිතා කරනු ඇත.

**චිත්‍ර සදහා උපදෙස්**

ගැහැණු ළමුන්ගේ අධ්‍යාපනය අප සැමට උදවු වන ආකාරය පිළිබද තරඟ කරුවන්ගේ දැක්ම චිත්‍රය තුලින් පිළිඹිබු විය යුතුය.

චිත්‍රයේ ප්‍රමාණය ඒ 4 ප්‍රමානයේ විය යුතුය.

චිත්‍රය වර්ණ හෝ කළු සුදු විය යුතුය.

ඔබ කැමති ඕනෑම මාධ්‍යයකින් චිත්‍රය ඉදිරිපත් කළ හැක (පාට පැන්සල් දියසායම් ආදී)

චිත්‍රය තුල අන්තර්ගත කල හැකි ඒවාට උදාහරණ:

- ක්‍රීඩා ක්‍රියාකාරකම්
- නිවසේ ක්‍රියාකාරකම්
- පාසල් පරිසරය
- සමුහ ක්‍රියාකාරකම්

**ප්‍රකාශන හිමිකම්**
චිත්‍ර ඉදිරිපත් කිරීම තුළින් සංවිධායකයන්ට එම චිත්‍රය ගෙවීමක් හෝ අවසර ලබා ගැනීමකින් තොරව ඉදිරිපත් කළ අයගේ නම, රට සහ වයස ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට වෙබ් පිටුවල ප්‍රසිද්ධ කිරීමට, ඉදිරිපත් කිරීම්වලට යොදා ගැනීමට ගෙවිමකින්, දැන්විමකින්, අවසර ගැනීමකින් තොරව සංවිධායකයින්ට අයිතිය පැවරේ.

**චිත්‍ර ඉදිරිපත් කිරිමට සුදුස්සෝ**

- ආසියා හා පැසිපික් කළාපයේ සියලුම ජාතීන්ට මෙම තරඟය විවෘතය.
- තරඟකරුවන් අවු 18 ට නොවැඩි විය යුතුය
- ගැහැණු පිරිමි දෙපාර්ශ්වයට ම මේ සඳහා සහභාගී විය හැක

සහභාගී විය හැකි වාර ගණන

**එක් සහභාගීවන්නකුට චිත්‍ර එකක් හෝ වැඩි ගණනක් ඉදිරිපත් කල හැකිය**

චිත්‍ර ඉදිරිපත් කරන්නේ කෙසේද
**චිත්‍රය සමඟ පෞද්ගලික තොරතුරු ඇතුලත් පත්‍රිකාවක් අමුණන්න. එසේම චිත්‍රය පිටුපස ඔබගේ සම්පුර්ණ නම, වයස, ස්ත්‍රී පුරුෂ භාවය සහ රට සදහන් කරන්න.**

**චිත්‍ර ඉදිරිපත් කිරීමෙන් සහභාගීවන්නන්ගේ පළමු නම ,වයස, රට යන තොරතුරු පමනක් ප්‍රකාශනවල ඇතුලත් කෙරේ. වෙනත් කිසිවක් ප්‍රසිද්ධ නොකෙරේ.**
**චිත්‍ර කඩදාසි වල හෝ ඩිජිටල් මාධ්‍යයෙන් ඉදිරිපත් කළ හැක. ඔබගේ චිත්‍ර පහත ලිපිනයට යොමු කරන්න නැතිනම් විද්‍යුත් තැපැල් මඟින් යොමු කරන්න.**

UNESCO Bangkok
APPEAL Unit
920 Sukhumvit Road, Prakanong, Klongtoey
Bangkok 10110, Thailand

email to: gender.bgk@unesco.org

(Digital submissions of drawings must be in a TIFF, EPS or JPEG format with a resolution of at least 300 dpi)

**චිත්‍ර ඉදිරිපත් කළයුතු අවසන් දිනය :**

- සියලු චිත්‍ර 2011 අගෝස්තු 01 දිනයට පෙර ලැබිය යුතුය
- ඡන්දය
- සියලු චිත්‍ර සඳහා වට දෙකක ඡන්ද විමසීමක් සිදු කෙරේ
- (1) පළමු වටයේ යුඑන්ජීඅයි හවුල්කරුවන්ගේ ඡන්ද විමසීම සිදු කෙරේ
- (2) දෙවන වටයේදී අන්තර්ජාලය මගින් මහජන ඡන්දවිමසිමක් සිදු කෙරේ
- ජයග්‍රාහී චිත්‍ර 2011 නොවැම්බර් මස ප්‍රකාශයට පත් කෙරේ
- වැඩි දුර තොරතුරු සඳහා පහත ඊමේල් ලිපිනයෙන් විමසිය හැක.

gender.bgk@unesco.org